# සාංදෘෂ්ටිකවාදී විචාර න්‍යාය සහ නවකතා විචාරය; විචාරාත්මක අධ්‍යයනයක්

ඩබ්. එම්. එන්. ඩී. වීරසිංහ
රුහුණ විශ්වවිද්‍යාලය
nadeeshaweerasinghe98@gmail.com

**සාරසංක්ෂේපය**

මානව පැවැත්ම විග්‍රහ කරමින් ජීන් පෝල් සාත්‍රෙ මානවවාදී අධ්‍යයනයක් වශයෙන් සාංදෘෂ්ටිකවාදී න්‍යාය ඉදිරිපත් කර ඇත. මෙම අධ්‍යයනය මගින් අපේක්ෂා කරන්නේ සාංදෘෂ්ටිකවාදී විචාර න්‍යායේ මූලික ප්‍රවේශ කෙරෙහි අවධානය යොමු කරමින් නූතන නවකතා විචාරයට සාංදෘෂ්ටිකවාදය භාවිත කිරීමේ යෝග්‍යතාවයි. මෙය තෝරාගත් නවකතා ත්‍රිත්වයක් ඇසුරින් විග්‍රහ කෙරෙයි. පර්යේෂණ ගැටලුව වන්නේ මානව චෛතසික විවරණය කිරීම කෙරෙහි සාංදෘෂ්ටිකවාදී විචාර න්‍යාය වැදගත් වන්නේ කෙසේ ද? යන්න අධ්‍යයනය කිරීම යි. මාර්ටින් වික්‍රමසිංහගේ **විරාගය**, එදිරිවීර සරච්චන්ද්‍රගේ **මළගිය ඇත්තෝ** සහ සයිමන් නවගත්තේගමගේ **සංසාරාරණ්‍යයේ දඩයක්කාරයා** යන යුගත්‍රයක නවකතා ත්‍රිත්වයක් මෙහි දී තෝරා ගැනිණි. නවකතා විචාරයේදී ගතානුගතික විචාර ක්‍රමවේද අභිභවා ගිය මානවවාදී අර්ථකථනයකට සාංදෘෂ්ටිකවාදී ප්‍රවේශය අවශ්‍ය වන බව අවධාරණය කිරීම අධ්‍යයනයේ අරමුණ විය. ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය යටතේ සාහිත්‍ය අධ්‍යයනය සහ නිරීක්ෂණය යන දත්ත රැස් කිරීම සිදු විය. සාංදෘෂ්ටිකවාදයේ දී මනෝවිශ්ලේෂණවාදය, විග්‍රහාත්මක දත්ත විශ්ලේෂණයේ න්‍යායාත්මක පදනම විය. බර්නාඩ් ෆ්‍රෙච්මන්ඩ් විසින් පරිවර්තනය කරන ලද ජීන් පෝල් සාත්‍රේගේ **සාංදෘෂ්ටිකවාදය** (**Existentialism**) කෘතිය අධ්‍යයනයේ පදනම විය. එහි ඇතුළත් සාංදෘෂ්ටිකවාදයේ මූලික ප්‍රවේශ අනුව නවකතා විග්‍රහ කරන විට පැහැදිලි වූයේ මානව චෛතසික සහ චර්යාවන්ගේ ක්‍රියාකාරීත්වය බාහිර සාධකවල බලපෑමෙන් ගොඩනැගුණ ද ඒවා විග්‍රහ කිරීමේ දී අනන්‍ය ලක්ෂණ පිළිබඳ සහ පොදු මනුෂ්‍යත්වයේ සාරය පිළිබඳ අවධානය චරිතවලට සාධාරණයක් ඉටු කරන බව යි. ලිංගිකත්වය, කුතුහලය, සමාජශීලීත්වය වැනි තත්ත්ව කෙරෙහි මිනිසා විවෘත ව මෙන් ම ආවෘත ව ද අනායාසයෙන් නැඹුරු වෙයි. අරවින්ද, දෙවොන්දරා සං වැනි චරිත මගින් මානවවාදී විචාරයේ අවශ්‍යතාව අවධාරණය කෙරිණි. නවකතා මගින් ස්පර්ශ කරන පුද්ගල අනන්‍යතා සහ ගතිකත්ව පිළිබඳ අවබෝධයක් මෙම චරිත මගින් අනාවරණය කරයි. සංස්කෘතික සම්මතවලට එකඟ නොවන චර්යා ගතානුගතික විචාර සම්ප්‍රදායන්ට අනුව අසම්මත යැයි විවේචනය කළ ද, මානව ස්වභාවය අනුව සාංදෘෂ්ටිකවාදය මිනිසා වැරදිකරුවෙකු කිරීමට පෙර චෛතසික ක්‍රියාවලිය විශ්ලේෂණය කරයි. විවෘත ජීවන ශෛලියක් අපේක්ෂා කළ ද, චින්තනයේ විවෘත බව කෙරෙහි අවධානය යොමු නොකර තිබීම මානව චරිත කෙරෙහි අපගාමී නිරීක්ෂණ සිදු කිරීමට හේතු වී ඇති බව අධ්‍යයනයෙන් අනාවරණය විය.

**ප්‍රමුඛ පදඃ** පුද්ගල අනන්‍යතාව, බාහිර සාධක, මනුෂ්‍යත්වයේ සාරය, මානවවාදය, සාංදෘෂ්ටිකවාදය

# Existentialism Theory and Criticism of Novels: A critical Study

W.M.N.D.Weerasinghe
University of Ruhuna
nadeeshaweerasinghe98@gmail.com

## Abstract

Analyzing human Existence, Jean Paul Sartre has presented the existentialism theory as a humanist study. In this contest the study is expected to analyze the impact of existentialism on modern novel focusing on the basic approaches of existentialism theory. The problem of the study is how the influence of the existentialism to interpret human thoughts in novel in humanistic way. The study launched through the analysis of Martin Wickramasinghe's Viragaya, Ediriweera Sarachchandra's Malagiya Etto, and Nawagattegama's Sansaranyaye Dadayakkaraya. The objective of the study is to emphasize the need of existentialism method for a humanistic interpretation in novel criticism. Under the qualitative research method, the data collected through the literature study. Existentialism and psychoanalysis were the theoretical foundations of data analysis. This study based on Jean Paul Sartre's existentialism, translated by Bernard Frechtmen. This study revealed that although activities of people emotions are formed by influence of external factors, in analyzing them, paying attention to the unique characteristics and essence of common humanity does justice of the characters. Man naturally tends to be open and close to toward situations like sex, curiosity, sociability. The need for humanistic criticism was emphasized by the characters of Aravinda and Devondara. Novels accustom the reader to a way of thinking that broadness of his critical outlook and mentality. These characters revealed that understanding of individual identities and dynamic that the novel touch on. Behavior that does not confirm to cultural norms is considered. This study signified that despite the expectation of an open life style, lack of focus on free thinking has led to regressive observation of human characters.

**Keywords:** Discrimination, Existentialism, Humanism, Individuality, Influences of external facts